කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 අප්‍රේල්/ මැයි/ ජූනි

සමාජීය විද්‍යා පීඨය

පුරාවිද්‍යාව - ARCH E3025

ප්‍රාග් ඉතිහාසය සහ මූල ඉතිහාසය

ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි                                        කාලය : පැය 03 යි

---

01. ප්‍රාග් ඓතිහාසික යුගය අධ්‍යයනය කිරීමට යොදාගත හැකි මූලාශ්‍ර මොනවාද? ඒවා යොදා ගැනීමේදී මතුවන ගැටළු සාකච්ඡා කරන්න.

02. "ඍජු කය ඇති මානවයා (Homo erectus) අප්‍රිකානු මහද්වීපයෙන් පිටමංව ලෝකයේ විවිධ ප්‍රදේශයන්ට සංක්‍රමණය විය." මේ පිළිබඳ ඔබගේ අදහස් තර්කාන්විතව ඉදිරිපත් කරන්න.

03. මිනිසා වානර ලක්ෂණ ඉවතලා මානව ලක්ෂණ වර්ධනය කරගත් ආකාරය ඔහුගේ ශාරීරික ලක්ෂණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

04. මානව විද්‍යාත්මක පර්යේෂණවලදී ලිකි පවුලේ දායකත්වය කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

05. නියෝලිතික යුගයේ මානව සමාජයේ ඇතිවූ විශේෂතා අධ්‍යයනය කරන්න.

06. පුරාණ සමාජය තුළ ලෝහ භාවිතය ජනප්‍රියවීමට හේතු සාකච්ඡා කරන්න.

07. විජය කුමරු පැමිණෙන විට ශ්‍රී ලංකාවේ පැවැති මානව සංස්කෘතිය පිළිබඳව පුරාවිද්‍යාත්මක සාධක ඇසුරින් අධ්‍යයනයක් කරන්න.

08. පහත සඳහන් මාතෘකා **<u>දෙකක්</u>** පිළිබඳව ප්‍රමාණවත් විස්තර සපයන්න.

    1. මුස්ටේරියන් සම්ප්‍රදාය
    11. බටදොඹ ලෙන
    111. ඕල්ඩුවියානුවාදීන්

***************************